# කවදාවත් බොරු කියන්න හොද නෑ



චමත්කා නෙතයා

# කවදාවත් බොරු කියන්න හොද නෑ

පළමු මුද්‍රණය  2023 දෙසැම්බර්

චමත්කා  නෙතයා

මහාමාය බාලිකා විදුහල

4 වසර C

ISBN 978-624-208-013-0

## පිදුම

ආදරයෙන් මා හදාවඩා
ගනිමින් රැකබලා
ගන්නා මගේ
දෙමාපියන්ටත් ,
අත්තම්මා සීයාටත් ගුරු
හරුකම් දෙන
ගුරුවරුන්ටත් මේ පොත
ආදරයෙන්
ගෞරවයෙන් පුද
කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01

# කවදාවත් බොරු කියන්න හොඳ නෑ


එකෝමත් එක දවසක් අම්මයි, තාත්තායි , නංගියි, මමයි අත්තම්මලගේ ගෙදර ගියා. නැන්දලාත් ඇවිල්ලා හිටියා.



නංගියි ,මල්ලියි,  මමයි, අයියයි සෙල්ලම් කෙරුවා.  එදා  අයියා කෑමක් හදමුද?  ඇහුවා.  අපිට  කොහින්ද  බඩු?  මල්ලි අයියාට හරස් වුණා.



අපි අත්තම්මාගෙන් ඉල්ලා ගනිමු. අයියා පිළිතුරු දුන්නා .ඒත් අයියා අපිට ලිපක් ? නංගි ඇසුවා. අපි හදමු නංගි .අපිට ගල් තියනවා . මැටි තියනවා. අපිට ඒවායින් හදන්න පුළුවන්. අයියා කිව්වා. හරි ඉක්මනට හදමු .හැමෝම කිව්වා. හැමෝම ඉක්මනින් ලිප හදලා ඉවර කරා.



මල්ලි ගිහින් අත්තම්මා එක්කන් එන්න. ගින්දර පත්තු කරන නිසා අපිට අත්තම්මා ඕනේ. අයියා හැමෝගෙම ආරක්ෂාව ගැන හිතලා කිව්වා. එතකොට ම අත්තම්මා එතැනට ආවා . පුතාලා මොනවද කරන්නේ ? අත්තම්මා ඇහුවා. අපි උයනවා. හැමෝම සතුටින් උත්තර දුන්නා. මාත් උදව් කරන්නම් . අත්තම්මා කිව්වා.



අත්තම්මේ මම ගිහින් එළවලු අරන් එන්නම්. නංගි අත්තම්මාගෙන් අවසර අරගෙන පොළට යන්න පිටත් වුණා. මල්ලිත් යන්න නංගි එක්ක. අයියා කිව්වා . මල්ලි අදිමදි කරමින් කුස්සිය වෙත ගියා.



එක පාරටම ලොකු සද්දයක් ඇහුණා. කට්ටිය කලබලෙන් ඉක්මනට මිදුලට දුවගෙන ආවා.



න◌ංගි වැටිලා. හොදටම කකුල තුවාල වෙලා ලේ ගලනවා. ඉක්මනට රෙදි පටියක් ගේන්න. අත්තම්මා කිව්වා .කෝ මේ මල්ලි. හැමෝම මල්ලිව හොයන්න ගත්තා.



චූටි පුතා ......චූටි පුතා ...... අත්තම්මා කෑ ගැසුවා. මල්ලි පිළිකන්නේ ඉදලා දුවගෙන ආවා. ඔයාට මම කිව්වා නේද නංගි එක්ක යන්න කියලා . බලන්න දැන් වෙච්ච දේ . අයියා කේන්තියෙන් කිව්වා .



මට යන්න කම්මැලි හිතුන නිසා මන් නංගිට බොරු කිව්වා තනියම අයියා යන්න කිව්වා කියලා. සමාවෙන්න නංගි මට මම ආය කවදාවත් බොරු කියන්නේ නෑ.



දැක්කා නේද යාලුවනේ බොරු කියලා වෙච්ච දේ ? අපි මීට පස්සේ බොරු නොකිය ඉමු. මගේ හොද යාලුවෝ මං කියන දේ අහනවා නේද ? අයියා ආදරයෙන් හැමෝගෙන්ම ඇහුවා.

ඔව් ...... .හැමෝම කෑ ගහලා උත්තර දුන්නා.

## <u>නිමි</u>



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01